**ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ද්විතීය භාග විභාගය - 2016, 2018 හා 2020 (2016 පුනර්) සඳහා පෙනීසිටින සියලුම අපේක්ෂකයින් සඳහා**

මෙය ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ද්විතීය භාග විභාගයට පෙනී සිටින සියලුම සිසුන් සඳහා කරනු ලබන දැනුවත් කිරීමකි. මෙම විභාගය ඇමුණුමහි සඳහන් අපේක්ෂිත කාලසටහනට අනුව සෞඛ්‍ය මාර්ගෝපදේශ යටත්ව පැවැත්වීමට දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය කටයුතු කරමින් සිටී.

විභාගය පැවැත්වීමට පෙර සති දෙකක කාලයක සිට විභාගය අවසන්වන තුරු පහත සෞඛ්‍ය උපදෙස් මාලාව පිළිපදින ලෙස සියලුම විභාග අපේක්ෂකයින්ට දන්වා සිටී.

**කරුණාකර ජෛව ආරක්ෂිත පරිසරයක රැඳී සිටින්න.**

1. අනවශ්‍ය සියලු සංචාරයන් සම්පූර්ණයෙන්ම නවත්වන්න, මංගල උත්සව, අවමංගල්‍ය උත්සව, විශාල රැස්වීම්, සාදවලට සහභාගී වීමෙන් වළකින්න, නිවස තුළ සිටින ඔබේ සමීපතම පවුලේ සාමාජිකයින්, රැකියා ස්ථානයේ සගයන් වැනි සීමිත පිරිසක් ඇසුරු කිරීමට ඔබට උපදෙස් දෙනු ඇත. මුඛ ආවරණ පැලඳීම, සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීම සහ නිතිපතා අත් සේදීම මගින් කොවිඩ් -19 වයිරසයට නිරාවරණය වීමේ අවදානම අවම වන අතර ආසාදිතයින්ගේ විභාගය අහිමි වීම සහ අනෙක් අය අවදානමට ලක් වීම අවම වේ.

2. ඔබ එන්නත ලබාගෙන නොමැති නම් ඉක්මනින් එන්නත් ලබා ගැනීමට උත්සාහ කරන්න.

3. විභාග කාලය තුළ, විභාග මධ්‍යස්ථානයන්හිදී සෞඛ්‍ය මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපැදිය යුතුය. එම නිසා ඔබ මුඛ ආවරණ පැලඳීම, සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීම සහ අත් සේදීම/ මද්‍යසාර අඩංගු දියරයකින් (හැන්ඩ් සැනිටයිසර්) අත් සේදීම කළ යුතුය. විභාග මධ්‍යස්ථානයන්ට ඇතුළු වීමට පෙර කාර්ය මණ්ඩලය විසින් කොවිඩ්-19 රෝග ලක්ෂණ සහ උෂ්ණත්වය පරීක්ෂා කරනු ලැබේ. දැනට පවතින මාර්ගෝපදේශයන්ට අනුකූලව උණ හෝ රෝග ලක්ෂණ ඇති කිසිවෙකු විභාග ශාලාවට ඇතුළත් කර ගනු නොලැබේ.

**ඔබට, විභාගය පැවැත්වීමට අදාල කාල සීමාවන් තුළ කොවිඩ් ආසාදිත වීම(ශිෂ්‍යයෙකු හෝ පවුලේ සාමාජිකයකු) හෝ රෝහල් ගතව ප්‍රතිකර ලබාගැනීමක් වැනි ගැටලුවක් තිබේ නම්, කරුණාකර දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය වෙත දැනුම් දෙන ලෙස දන්වා සිටිමි.**

අධ්‍යක්ෂ

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය

12.09.2021